
රෙද්මන්
ජී.එච්. අප්සරා අභිමානි රණවීර

# රෝමන්

ජී.එච්. අප්සරා අභිමානි රණවීර

# රෝමන්

## ජී.එච්. අප්සරා අභිමානි රණවීර

**කර්තෘගේ වෙනත් කෘති :**

- **අපේ ජනකවි (ISBN 978-624-211-002-8)**

| | |
|---|---|
| **පාසල** | **: මහ/විහාරමහාදේවි  බාලිකා විදුහල** |
| **ඉගෙනුම ලබන පංතිය** | **: 07 ශ්‍රේණිය** |
| **කෘතිය පල කරන දිනය** | **: 25.04.2026** |

**ISBN අංකය : 978-624-211-077-6**

# පිදුම

මෙම කෙටිකතා සංග්‍රහය සැකසීමට මා හට නිති මාර්ගෝපදේශ

සැපයූ

ආදර අප්පච්චිටත්, අම්මාටත්, අක්කාටත්, නංගීටත්,

විහාරමහාදේවි බාලිකා විදුහලේ ගුරුමැණිවරුන්ටත්,

පියවරුන්ටත් මේ අවස්ථව ලැබදුන්

මහමායා බාලිකා විදුහලේ විදුහල්පතිතුමිය ඇතුළු

ආචාර්ය මණ්ඩලයේ සැමටත්,

නිති ගුරුහරුකම් ලැබදෙන සිසිර ගමගේ සීයාටත්

මෙම පොත පුදමි...

# පෙරවදන



දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සූදානම් කරන බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂ්‍යයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් සිදු කරන හේමමාලා උපහාර ගත්කරන ව්‍යාපෘතිය නම්කළ හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකි. මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමුකරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පූජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩමකර වූ හේමමාලා කුමරියට උපහාර දැක්වීම මෙවර අපගේ මූලික අරමුණයි. මේ සදහා නිර්මාණකරණයෙන් දායක වූ පාසල් දරුවන් මගපෙන්වූ ගුරුභවතුන් ඇතුළු සැමට ස්තූතිය පුදකරමු.

ශශිකලා සේනාධීර
විදුහල්පතිනිය
මහාමායා බාලිකා විද්‍යාලය

# සුභාශිංසන පණිවුඩය

මහනුවර මහාමාය බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් නිර්මාණය වූ ග්‍රන්ථ එළි දැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සළකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර, එය පොත්පත් හා සාහිත්‍ය නිර්මාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ. සිසු දරුවන්ගේ දක්ෂතා, නිර්මාණශීලීත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මඟින් මතුවීම ඉතා ප්‍රශංසනීය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව, සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම, මෙවැනි උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාර්ථක කටයුත්ත සඳහා කැපවූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිර්වාදය පිරිනමමි. මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළි දැක්වීමේ උත්සවය විශිෂ්ට සාර්ථකත්වයක් ලබනු ඇතැයි ප්‍රාර්ථනා කරමි.

සරත් බී.එස්. අභයකෝන්,
ආණ්ඩුකාරවර,මධ්‍යම පළාත.
සම්මානිත මහාචාර්ය ,
පේරාදෙණිය විශ්වවිද්‍යාලය.
2026-05-10

# සුභාශිංසන පණිවුඩය

වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථකරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩමකළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළි දැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය, ශිෂ්‍ය දියණිවරුන්, සෙසු පාසල්වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ක්‍රියාවට නැංවීමට කැපවූ සියලු දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි

ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්, අනිවාර්ය, ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමඟින් අනාගතයේදී බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටී. එවන් පසුබිමක සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, විචාරශීලී චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පාදක වේ. ශ්‍රී දළදා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමි.

ප්‍රදීප් නිලංග දෑල,
දියවඩන නිලමේ,
ශ්‍රී දළදා මාලිගාව
2026.05.10

# හැඳින්වීම

සාහිත්‍ය නම් ගද්‍ය, පද්‍ය, චම්පු ලෙස සරලව හැඳින්විය හැකි බව මා අසා ඇත. "පොතක් කියවීම නම් අප නොදුටු නොවිරූ ලෝකෙකට පියමැන්නාක් බඳු යැයි" කියමනක් ඇති බව ද මා අසා ඇත. කෙසේ වෙතත් අද සමාජයේ පොත් කියවීම වෙනුවට දුරකථනය අතේ තබා ගැනීම සිරිතක් වී ඇත. කියවීමෙන් දුරස් වී ඇත. අපට දැනුම ලබා ගත හැකි තවත් එක් සාහිත්‍යාංගයක් ලෙස කෙටි කතා දැක්විය හැක. කෙටි කතාව ඉතාමත් කෙටි කලකින් කයවා නිම කළ හැකි නිසා කියවීමට රුචියක් දක්වන අය එක හුස්මට කියවති.

සමාජයේ මා හට නිතර අසන්නට දකින්නට ලැබෙන සිදුවීම්, අත්දැකීම් ඇසුරෙන් මේ කෙටිකතා මා විසින් නිර්මාණය කරන ලදි.

# පටුන

පිටු අංක


| | | |
|---|---|---|
| 1. | පුංචි අප්පුවා | 1-2 |
| 2. | අඹ ගස | 3-4 |
| 3. | අත කැඩීම | 5-6 |
| 4. | සියදෝරිස්ගේ ලේන්සුව | 7-8 |
| 5. | රෝමන් | 9-10 |
| 6. | පරණ රේඩියෝ එක | 11 |

# පුංචි අප්පුවා



පුංචි අප්පුවා තමන්ගේ තාත්තාව කවදාවත් දැකලා තිබුණේ නෑ. පුංචි අප්පුවා හිටියේ අම්මයි අත්තම්මයි එක්ක. අප්පුවා පාසලේ හතර ශ්‍රේණියේ ඉගෙනුම් ලැබුවේ. ඔහු පාඩම් වැඩවලට හරිම දක්ෂයි. ඔහු සැමදාම විභාගයෙන් පළමු වන ස්ථානය ලබා ගනියි. අප්පුවා හැමදාම කැලයට ගොස් පලා කඩාගෙන ගොස් ධනපාල මුදලාලිගේ කඩයට විකුණයි. ඔන්න අවුරුද්දත් ළඟ ළඟම එයි. අම්මයි අත්තම්මයි අවුරුද්දට කැවුම්, කොකිස්, අළුවා වැනි දේවල් ඔවුන් සාදති. පුංචි අප්පුවාට තාමත් දුකයි ඔහුගේ තාත්තා අවුරුද්දට නොපැමිණීම නිසා.

දිනක් අප්පුවා කැලයට ගියේ ය. ඔහු යන අතරමගදී ඔහු නොදැකපු මිනිසෙක් හමු විය. එම මිනිසා හරිම කරුණාවන්තයි. ඔහු පුංචි අප්පුට පලා වට්ටි දෙකක් ලබා දුන්නේ ය. පුංචි අප්පු ඔහුට ස්තූති කළ සතුටින් ධනපාල මුදලාලිගේ කඩපිලට ගියේ ය. එය විකුණා රුපියල් දෙදාහක් ලබා ගත්තේ ය. අප්පුවා එම මුදල් රැගෙන නිවසට ගියේ ය. අම්මා ඇඳුම් මැසීමට හරිම දක්ෂයි. අම්මා එම මුදල් රැගෙන ගොස් අවුරුද්දට රෙදි පිළි ගත්තාය.

අවුරුදු දවස උදා විය. පුංචි අප්පු වේලාසනින් අවදි විය. ඔහු අවදි වන විට ඔහුට හුරුපුරුදු මිනිසෙක් නිවසට ඇතුළු වී තිබිණි. එම මිනිසා කැලෑවේ  දුටු මිනිසා වේ. අම්මා පුංචි අප්පුට මෙසේ පැවසීය. "මේ ඉන්නේ උඹෙ අප්පොච්චා" යැයි. පුංචි අප්පුට අදහා ගත නොහැකි සතුටක් පියමැන්නේය.

ඔහුගේ තාත්තා අප්පුට කේක් ගෙඩියක් රැගෙනවිත් තිබින. ඔවුන් කිරිබත්, අතිරස, අළුවා රස වින්දේය. පුංචි අප්පුට අද කියාපු නිති සතුටක් ආවේ ය. එම පුංචි පවුල සතුටින් අවුරුදු කෑහ.

# අඹ ගස



පවනිට හිටියා අම්මයි තාත්තයි අයියල හතරදෙනයි. පවනි චුට්ටක් දඟයි. එයා සෙල්ලම් කරන්න හරිම කැමතියි. එයාට යාළුවෝ ගොඩාක් හිටියා. පවනිගේ ගෙදර ළඟ තවත් ලොකු බංගලාවක් තිබුනා. එහෙ හිටියා මාමා කෙනෙක්. පවනියි එයාගේ යාළුවොයි එයාට කිවුවේ "අමුඩේ මාමා" කියලා. ඒ මොකද ඒ මාමා හැමවෙලාවෙම අමුඩේ ගහගෙන හිටපු නිසා.

ඔන්න එ දවසක් ඒ බංගලාවේ තිබුණු අඹ ගසක් කපලා තිබුණා. ඒ ගහ ලොකුම ලොකුයි. ඒකේ එක අත්තක් තවත් ලොකු ගසක් වගේ. ඔන්න ඒ වගේ අත්තක් පාරට වැටිලා තිබුණා. ඉතින් ක දැක්ක පවනියි

එයාගේ යාළුවොයි. පවනි එයාගේ යාහළුවොත් එක්ක ඒ ගහ ළඟට ගියහ. ඔන්න යාළුවෝ ඒ අත්තත් එක්ක සෙල්ලම් කරන්න ගියා. ඔහොම සෙල්ලම් කරමින් සිටිය දී පවනි ඒ අත්තෙන් ලිස්සලා වැටුනා. ඒ වැටිච්ච පාරට පවනිට නැගිටින්නවත් පනක් තිබුණේ නෑ. ඒ අත උළුක් වෙලා තිබුණා.

යාළුවෝ හැමෝම එයාව දාලා ගියා. පවනිට බය හිතුනා එයාගේ අයියා එයාට බනියි කියලා. ඊට පස්සේ පවනි ගඩොල් ගොඩක් අස්සේ හැංගුණා. ඔන්න එතනින් ගිය මිනිසෙක් පවනිව දැක්කා. එයා මුකුත් කියන්නත් කලින් පවනි "මට මුකුත් උනේ නෑ ඔයා යන්න" කියලා කිවුවා. ඒ මිනිහා දැනගත්තා මේ ළමයට මොකක් හරි වෙලා කියලා. ඊට පස්සේ එතනින් ගියපු පවනිගෙ අයියට මේ ගැන කිවුවා. පවනිගේ අයියාට තරහ ආවා. ඊට පස්සේ අයියා පවනිව වඩාගෙන වෙද ගෙදරට ගියා. ඉන්පසු ඇයට පත්තු බැන්දා.

ඒක බැන්දේ උණ පතුර තියලා ඒවා ඇතුළට බෙහෙත් කොළ දැම්මා. ඊට පස්සේ ඔන්න ගෙදර ගියා. ඔන්න දැන් රෑ වුණා. හැමෝම නිදි අතරේ පවනි අතේ තිබුණු බෙහෙත් කොළ උණ පතුරු අස්සෙන් අයින් කරා. එහෙම ගොඩ දවසක් එහෙමම කරා. හැමදාම වෙද මහත්තයාගෙන් බැනුම් ඇහුවා. ඔන්න ඉතින් අතත් හොඳ වුණා. පවනිට හරි සතුටුයි. ඊට පස්සේ ආයෙත් සෙල්ලම් කරන්න පටන් ගත්තා.

# අත කැඩීම



ඔන්න ඉතින් පවනිගේ අතත් හොඳ වෙලා. පවනි දැන් ඉස්කෝලෙත් යනවා. පවනි දැන් සෙල්ලම් කරනවා. එයාට දැන් කිසිම බයක් නෑ. පවනි ඉස්කෝලෙ යන්න සූදානම් වෙනවා. ඊටපස්සෙ ඉස්කෝලෙ ගියා. ඔන්න දැන් විවේක කාලය ඇරඹුනා. පවනි යාළුවන් එක්ක දුවගෙන ගියා පට්ටනියට. එක තැනක් තිබුණා කවුරුත් ප්‍රයෝජනයට ගත්තෙ නැති. ඒකෙ වල් උසටම වැවිලයි තිබුණේ. ඒකේ කලකඩ කාපු කම්බියක් බිම තියනවා කවුරුත් දැක්කේ නෑ.

ඔන්න ඉතින් පවනි ඒ වල් වැවුණු වත්තට ඇවිත් දුව දුව හිටියා. ඊටපස්සේ අර මලකඩ කාපු කම්බියේ පැටලිලා වැටුණා. ඊටපස්සේ අර කැඩුනු අත ආයෙමත් උළුක් වුනා. ඔන්න ඉතින් ඊටපස්සේ ආයෙමත් අර ගමේ වෙදරාලගේ නිවසට ගියා. ඊටපස්සේ අත හොඳ කිරීමට පොඩි ක්‍රියාකාරකමක් දුන්නා. ඒ මොකක්ද දන්නවද? අර කැඩිච්ච අතෙන් වතුර බාල්දියක් උස්සගෙන වෙදරාලගේ ගෙදර වටයක් යෑම. ඔන්න ඉතින් පවනි මොකද කලේ ගෙදර වටේ යනකොට වෙදරල සිටිය තැන පහුකරලා යනකොට අත කැඩුනු නැති අතට මාරු කර ගත්තා. ආයෙත් වෙදරාල ඉන්න තැනට යද්දී ඉක්මනින් අනිත් අතට මාරු කර ගන්නවා. ඔහොම දවස් කිහිපයක් යනකොට ඔය හොර වැඩේ දැනගත්තා වෙදරාල. ඊටපස්සේ වෙදරාල "මට මෙයාට බෙහෙත් කරන්න බෑ. මෙයාවත් ඇරගෙන ගෙදර යන්න" කියා පැවසුවා.

# සියදෝරිස්ගේ ලේන්සුව



ඔන්න පවනිගේ ගමේ හිටියා සියදෝරිස් කියලා මාමා කෙනෙක්. එයා හරිම මෝඩයි. එයා හැමවෙලේම කර වටේ පොඩි තුවායක් බැඳගෙනයි ඉන්නේ. ඒක එයා හැම තැනකටම ඇරන් යනවා.

සියදෝරිස් මාමා හොල්මන්වලට බයයි. හැබයි අනික් අයට කියන්නේ ඔහු හොල්මන්වලට බය නෑ කියලා. ඉතින් එයා අනික් අයට හැමවෙලාවෙම එයා බය නෑ කියලා පෙන්වනවා. ඉතින් මිනිස්සු

මෙයාට කිව්වා ගමේ තියන සොහොනට ගිහින් ලෑල්ලකට ඇණයක් ගහන්න කියලා. රෑ දොළහට තමයි යන්න කිවුවේ. ඉතින් ඔන්න රෑ වෙද්දී ඇඳුම් ඇඳගෙන ලේන්සුවක් දාගෙන බයෙන් බයෙන් සොහොනට ගියා. ඊටපස්සේ ලීයකට ඇණයක් ගැහුවා. ඊටපස්සේ බයට පන බයේ දුවන්න යද්දී කවුදෝ සියදෝරිස් මාමාගේ ලේන්සුවෙන් අල්ලනු ඉන්නවා වගේ දැනුණා. ඊටපස්සේ ලේන්සුවත් එතනම තියලා දිවුවා. ඔන්න ඉතින් ඊළඟ දවසේ ඒ වැඩේ කරන්න කිවුව මිනිසුන් ළඟට ගිහින් වෙච්ච සිද්ධිය කිව්වා.

ඊටපස්සේ ඒ මිනිසුන් අර සොහොනට ගියා. ඊටපස්සේ දකින්න ලැබුණේ සියදෝරිස් මාමා අර ලීයට ඇණයක් ගහද්දී ලේන්සුවටම අල්ලලා ගහලා. තියන බය නිසාම අනික් අය අතරේ ලැජ්ජාවටද පත් වුණා.

# රෝමන්



රෝමන්ගේ ගෙදර හිටියා එයාගේ අයිතිකාරයයි අයිතිකාරියයි. එයාලා සතියකට යනවා දුර ගමනක්. ඒ යන්නේ රෝමන්ව කණුවක බැඳලා. රෝමන්ගේ පැටවු තුන්දෙනා පාරට දාලා යනවා. දැන් ඉතින් ලොකු අනෝරා වැස්සකුත් ආවා. ඒ වැස්සට ලොකු බල්ලයි පැටවු තුන්දෙනයි හොඳටම තෙමුණා. ඒ වුනාට බලු පැටව් තුන්දෙනා එයාලගේ අම්මව දාලා ගියේ නෑ. ඔන්න මේ රෝමන්ගේ බෙල්ලේ බැඳලා තිබුණු බඳ පටිය කැඩිලා ගියා. මොකද වැස්ස නිසා ඒක

තෙමිලා. ඒ නිස ඒක කැඩුණා. ඊටපස්සේ රෝමන් ඇයගේ පැටවු එක්ක ගියා පාරට. ඉතින් ඊටපස්සේ එයාලට හම්බුනා පාර අයිනේ සීයා කෙනෙක් හමුඋණා. රෝමනුයි එයාගේ පැටවුන් එක්ක ඒ සීයා ළඟ හිටියා. ඉතින් එදත් වැස්ස වැස්සා. ඊටපස්සේ අර සීයා එයා ළඟ තිබුණු රෙදි කැබැල්ල රැගෙන බලු පැටවුන්ට හා රෝමන්ගේ ඇඟට එම රෙදි කැබැල්ල එළුවා. ඊළඟ දවසේ අර සීයට හොඳටම ලෙඩ. එයා හොඳටම වෙවුලනවා. ඊටපස්සේ රෝමන් ඉක්මනින් ඖෂධ හලක් හොයාගෙන ගියා බලු පැටවු තුන්දෙනා සීයා ළඟටම වෙලා හිටියා. ඊටපස්සේ රෝමන් ෂධ හලක් හොයාගෙන ගිහින් වෛද්‍යවරයෙක්ගේ කලිසමකින් ඇද්දා. ඒ වෛද්‍යවරයත් රෝමන්ගේ පස්සෙන් ගියා. ඊටපස්සේ එයා දැක්කා අර සීයාට හොඳටම ලෙඩ කියලා.

ඊටපස්සේ වෛද්‍යවරයා ඒ සීයාට රෝහලට රැගෙන ගිහින් බෙහෙත් කරා. ඊටපස්සේ ඒ සීයාට රජයෙන් පොඩි නිවසක් ඔහුට පරිත්‍යාග කරා. ඊටපස්සේ රෝමනුයි එයාගේ පැටවු සමඟ සීයා එම නිවසේ සතුටින් ජීවත් වුණා.

# පරණ රේඩියෝ එක

නුවර පැත්තේ කුඩා කඩේක රත්නේ අයියා කියලා කෙනෙක් හිටියා. එයාගේ කඩේ පරණ බඩු විතරයි. කවුරුහරි ගෙදර පරණ බඩු දෙනකොට රත්නේ අයියා ඒවා අරගෙන තෙල් ගාලා, ඔප දාලා ආයෙත් විකුණනවා.

එක දවසක් අවුරුදු අසූවක ආච්චි කෙනෙක් ඇවිත් පරණ රේඩියෝ එකක් දුන්නා. "මගේ මිනිහා මැරෙනකන් මේකෙන් සිංදු ඇහුවා. දැන් මට ඒක බලන්නත් බැහැ" කියලා අඬ අඬා දුන්නා.

රත්නේ අයියා ඒ රේඩියෝ එක ගත්තා. දවස් දෙකක් තිස්සේ ඒක හදනවා. ඇතුළත තාමත් පරණ බැටරියක් තිබුණා. ඒක ගලවද්දී කඩදාසි කෑල්ලක් වැටුණා. ඒකේ ලියලා තිබුණේ:

"මගේ ආදරේ, මම යුද්දෙට යනවා. ආයෙ එනකන් මේ රේඩියෝ එකේ අටට එන සිංදුව අහන්න. මගේ හඬ ඒකේ තියෙනවා."

රත්නේ අයියාට තේරුණා මේක සාමාන්‍ය රේඩියෝ එකක් නෙවෙයි කියලා. එයා ඒ රේඩියෝ එක විකුණුවේ නෑ. ඒ වෙනුවට ආච්චිටම අරගෙන ගිහින් දුන්නා.

හවස අටට රේඩියෝ එක දැම්මා. ඇත්තටම ඒකෙන් පැරණි ගීතයක් ආවා. ආච්චි අඬ අඬා කිව්වා "ඔව්... මේ එයාගේ කටහඬ".

පස්සේ රත්නේ අයියා කිව්වා "ආච්චි, සමහර බඩු වලට ගාණක් දාන්න බෑ. ඒවායේ මතක කියන වස්තුව තියෙනවා" කියලා.

එදා ඉඳන් ගමේ මිනිස්සු පරණ බඩු විකුණන්න යන්නේ රත්නේ අයියා ළඟට. එයා ඒවායේ ගාණ බලන්නේ නෑ, කතාව අහනවා.

**කතාවේ තේරුම : සමහර දේවල් වල වටිනාකම තියෙන්නේ මිලෙන් නෙවෙයි, මතකෙන්.**

# ස්තූතිය

මෙම පොත සැදීමේදී මා හට උදව් කළ, මා මේ සඳහා යොමු කළ කිහිපදෙනෙකු පිළිබඳ සටහන් කර තබමි. මගේ අක්කා අනුසරා අභිෂේකකි රණවීරත්, තලාතුඔය විජය කළායතනයේ අධිපති ජී.එච්. විජේවික්‍රම මහතාත්, පොඩි අත්තම්මාත්, ආදරණීය අත්තම්මලා දෙදෙනාත්, මගේ දෙමව්පියන් වගේම මගේ පාසලේ සිංහල විෂය භාර තනුජා ගුරුමෑණියනුත් ඒවගේම නිරන්තරයෙන් පොත් ලිවීම පිළිබඳ ගුරුහරුකම් දෙන සිසිර ගමගේ සීයාටත් බෙහෙවින් ස්තූතිවන්ත වෙමි.

# පසුවදන



අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් දැයට දායාද කළ මෙම ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වූ වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණවලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමුකර වීම ව්‍යාපෘති ගමන්මගේ හැරවුම් ලක්ෂ්‍යයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම් පරාවකට අනාගත ලෝකය පෙන්වාදෙන නූතන පාසල නූතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිශීලනය කළ යුතු බව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන්කිසිවකින් වත් ලබා දිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දුරස් වීම වළක්වා ගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් "හේමමාලා උපහාර" ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය දියත් වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබළ ගැන්වීමට ඉතිහාසයේ යුග මෙහෙවරක් ඉටු කළ හේමමාලා කුමරියට උපහාර දැකවීම ද මෙහි මූලික අරමුණයි.

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාටද, දියවඩන නිලමෙතුමන් ඇතුළු ශ්‍රී දළදා මාලිගාවේ කාර්ය මණ්ඩලයටද මෙම සත්කාරය වෙනුවෙන් ස්තූති වන්ත වෙමු.

සෙනෙවිරත්න මහලේකම්
(ව්‍යාපෘති නිර්මාතෘ)